මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සි හා එහි පරිපාලිත සමාගම් 2019
---

**1.1** මතය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සි හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැළී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම, ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ, තහවුරුවක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිවම හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දූස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට සමූහයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව;
- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | පවතින ණය පහසුකම්වල පරිණත වන දිනය, කාලය සහ පොළී අනුපාතය සමාගම විසින් වෙනස් කළ අවස්ථා නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම පහසුකම් සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් ප්‍රතිව්‍යුහගත කර ඇති හෝ නැවත සකස් කර ඇති ලෙස ග්‍රහණය කර ගෙන නොමැත. | ගණුදෙනුකරුවන්ගේ ඉල්ලීම අනුව ඔහුන්ගේ වාරිකය ගෙවිය යුතු දිනය වෙනස් වීම නිසා පරිණත වන දිනයන් වෙනස් වී ඇත. පෙනෙන ආකාරයට කාලය වෙනස් වී නැත. කෙසේ වෙතත්, මෙම කරුණ තවදුරටත් තහවුරු කරනු ලැබේ. නිලධාරියකු බැංකුවේ සේවයෙන් ඉල්ලා අස් වන විට කාර්ය මණ්ඩල ණය මුදලේ පොලී අනුපාතය වර්තමාන වෙළෙඳපොළ පොලී අනුපාතයට ගැලපීම නිසා පොලී අනුපාතය වෙනස් වී ඇත. | නැවත සකස් කරන ලද සහ ප්‍රතිව්‍යුහගත කළ ණය නිවැරදිව ග්‍රහණය කර ගැනීම සඳහා පද්ධතිය වැඩිදියුණු කිරීමට නිර්දේශ කෙරේ. |
| ii | 2019 දෙසැම්බර් 31 දිනට ණය කළඹ තුළ ඍණ ශේෂ සහිත පහසුකම් හතක් සහ රු. 1 සිට රු. 10 දක්වා වූ පරාසයකින් යුත් සුළු ශේෂ සහිත තවත් පහසුකම් 310 ක් නිරීක්ෂණය විය. | අනාගතයේදී ශුන්‍ය හෝ ඊට අඩු ඍණ ශේෂ සහිත පහසුකම් කළඹෙන් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ඍණ සහ සුළු ශේෂ පද්ධතියෙන් ඉවත් කිරීමට නිර්දේශ කෙරේ. |
| iii | රු. මිලියන 2,375 ක් වටිනා පහසුකම් 13,379 ක් අක්‍රීය පහසුකම් ලෙස පද්ධතිය තුළ සලකුණු කර ඇතත් ඒවාට එරෙහිව කිසිදු නීතිමය පියවරක් ගෙන නොමැත. | ලේඛනගත කිරීමේ අඩුපාඩු කිහිපයක් නිසා මෙය ප්‍රමාද විය. | පැහැර හරින ලද ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |
| iv | ශුන්‍ය නිදහස් කිරීම් සහිත පහසුකම් හැත්තෑවක් නිර්මාණය කර ඇති අතර ඒවා කළඹට ඇතුළත් කර ඇත. අරමුදල් ගනුදෙනුකරුවන් වෙත තවමත් නිදහස් කර නොමැත. පහසුකම් හැත්තෑව අතුරින් පහසුකම් 30 ක් 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන් තුළ නිර්මාණය කර ඇත. | පහසුකම් හැත්තෑව තුළ කල්බදු පහසුකම් 04 ක් ඇතුළත් වූ අතර අනෙකුත් පහසුකම් උකස් පහසුකම් වේ. කල්බදු පහසුකම් තුනක් දැනටමත් නිදහස් කර ඇති අතර අනෙත් පහසුකම වසා දමා ඇත. උකස් අත්තිකාරම්වලට අදාළ ශුන්‍ය ශේෂ සක්‍රීය කළඹෙන් ඉවත් කර ඇත. | ශුන්‍ය නිදහස් කිරීම් සහිත පහසුකම් පද්ධතියෙන් ඉවත් කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| v | අක්‍රිය ගනුදෙනුකරුවන් ලෙස පද්ධතිය තුළ සලකුණු නොවූ නඩු පවතින පහසුකම් 213 ක් ඇත. | සාමාන්‍යයෙන් පද්ධතිය හරහා නීති අංශය වෙත පහසුකමක් මාරු කළ විට එය නෛතික ලෙස සලකුණු වේ. කෙසේ වෙතත්, නෛතික උප පද්ධතිය සහ අත්සන් පද්ධතියේ විස්තර සංසන්දනය හා විශ්ලේෂණය සඳහා වැරදි වාර්තාව තෝරාගෙන තිබේ නම්, විශ්ලේෂණය වෙනස් වේ. අපි තවදුරටත් විශ්ලේෂණය කරනු ඇත. | පද්ධතිය තුළ සියළු අක්‍රිය ගනුදෙනුකරුවන් සලකුණු කිරීම සඳහා එම පද්ධතිය වැඩි දියුණු කිරීමට නිර්දේශ කෙරේ. |
| vi | විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව වසා ඇති බැංකු ගිණුම් දෙකක් තවමත් පොදු ලෙජරයේ සක්‍රීය ලෙස පවතී. | එකඟ වේ.<br>සැසඳීම සඳහා අවශ්‍ය තොරතුරු ලැබීමෙන් මුදල් සැසඳීමෙන් අනතුරුව පොදු ලෙජරය 2020 වර්ෂය අවසන් වන විට වසා දමනු ඇත. | අදාළ ගිණුම් වසා දැමීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට නිර්දේශ කෙරේ. |
| vii | පොදු ලේජරයට ගැලපීමෙන් තොරව (ශ්‍රී.ල.මු.වා.ප්‍ර ගැලපුම්) මූල්‍ය ප්‍රකාශනවලට, පසුව සෘජුවම යොදන ලද ජ'නල් සටහන් කිහිපයක් තිබුණි. එවැනි තොරතුරු පැතුරුම්පත් මත පවත්වා ගෙන යනු ලැබේ. මෙය දත්ත නැතිවීමට හෝ හැසිරවීමට හේතු විය හැක.<br>එබැවින්, එවැනි සටහන්වල දත්ත නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාවලියක අවශ්‍යතාවය බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. | පද්ධතියෙන් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීම ප්‍රායෝගික නොවන අතර අනාගත සියළු තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණභාවය පරීක්ෂා කිරීමට අප සහතික වන්නෙමු. | දත්ත සුරකීම සහ නිරවද්‍යතාවය සහතික කිරීමට මූල්‍ය වාර්තාකරණය සඳහා පද්ධති විසඳුමක් සඳහා සමාගම යා යුතුය. |
| viii | සමාගමේ සමස්ත හානිකරණ ගණනය කිරීමේ පෙරවැඩ එක්සෙල් වැඩපොත්වල අතින් සිදු කරන අතර එය හානිකරණ ඇස්තමේන්තුවේ ප්‍රමාණවත් දෝෂ පැවතීමේ අවදානම වැඩි කරයි. | හානිකරණයේ ප්‍රධාන ක්‍රියාවලිය වන එල්.ජී.ඩී, පද්ධතියෙන් ගණනය කරයි. ඊට අමතරව, හානිකරණ ආගණනය ගණනය කිරීමට පෙර කළඹේ ශේෂයන් එක්සෙල් වැඩපොත් සමඟ එකඟ වන බව මූල්‍ය අංශය විසින් නැවත පරීක්ෂා කරයි. | හානිකරණ ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන දත්ත ප්‍රතිදානවල සංවරණය හා තුලනය වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කළමනාකරණයට නිර්දේශ කෙරේ. |
| ix | සමාගමේ රු. 1,311,828 ක් වූ රඳවා ගැනීමේ බදු, සහතික පත් නොමැති වීම නිසා ආදායම් බදු ප්‍රකාශනයට ඇතුළත් කර නොමැත. | 2020 මූල්‍ය වර්ෂය අවසන් වන වීමට පෙර සහතික පත් ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තුවලට නොහැකි නම් ශේෂයන් කපා හැරීමට කළමනාකරණයෙන් අනුමැතිය ලබා ගත යුතුව ඇත.<br>අනාගතයේ දී මූල්‍ය වර්ෂය තුළ අදාළ දෙපාර්තමේන්තුවලින් සහතික පත් එකතු කර ගැනීමට පසු විපරම් දැඩිව සිදු කර යුතුව ඇත. | රඳවා ගැනීමේ බදු සහතික පත් නිසි පරිදි පවත්වා ගෙන යාමට කළමනාකරණයට නිර්දේශ කෙරේ. |

### 1.5.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i වැඩිපුර ගෙවීම් ගිණුමේ 2019 මාර්තු 31 වන දිනට රු.4,470,035 ක අතිරික්තයක් පැවති අතර බැංකුවට එය ණය හා කල්බදු කළඹට එරෙහිව අනාවරණය කර ගැනීමට නොහැකි විය. එසේම ඉහත අතිරික්තයේ වයස්ගත වීම් සැපයීමට සමාගමට නොහැකි විය. | ණය වැඩිපුර ගෙවීම්වලට අදාළව තනි තනි පහසුකමට අනුව සවිස්තරාත්මක තොරතුරු පවති. පහසුකම් පියවීමට පෙර ශාඛා නිලධාරීන් විසින් පවතින වැඩිපුර ගෙවීම් මාරු නොකරනු ඇත. එබැවින් වැඩිපුර ගෙවීම් ශේෂය ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. | පොදු ලෙජර ශේෂයන් අදාළ කළඹේ ශේෂයන් සමඟ සංසන්දනය කර ඇති බවට සහතික වීම. |
| ii මූල්‍ය ප්‍රකාශන අනුව, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ කොටස් 540 ක් බැංකුව සතු වේ. කෙසේ වෙතත්, කොටස් සහතික පත අනුව කොටස් 100 පමණක් මිලදී ගෙන ඇත. | කොටස් ප්‍රමාණය නිශ්චිතව තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් තහවුරුවක් කැඳවිය හැක. 2020 දෙසැම්බර් වන විට අදාළ කරුණ නිවරදි කෙරේ. | බැංකුව සතු නිශ්චිත කොටස් ගණන සහතික කිරීම. |

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් රු.2,867,968 ක හර ශේෂයන් හා රු.2,525,500 ක බැර ශේෂයන් සැසඳීමට සමාගමට නොහැකි වූ අතර අදාල ශේෂයන් සඳහා මුල් ලිපි ලේඛන හෝ සහයක ලිපි ලේඛන සැපයීමටද නොහැකි විය. | රු.1 , 418,425 ක ශේෂය 2020 ජනවාරි 30 දිනට නිවරදි කර ඇති අතර අනෙකුත් ශේෂයන් 2020 දෙසැම්බර් 31 ක දිනෙන් අවසන් වන වර්ෂයෙදී නිවැරදි වනු ඇත. | අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් ශේෂයන් සැසඳීමට හා නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ. |

### 1.5.4 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i තවමත් භාවිතා කරනු ලබන රු.මිලියන 436 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ සමාගම සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. භාවිතා කිරීමේ තත්ත්වය මත පදනම්ව එම වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට බැංකුව කටයුතු කර නොමැත. | පද්ධතියක් මත පදනම් වූ දේපල, පිරියත හා උපකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය 2020 වසර අවසන් වන විට නිම කළ යුතුව ඇත. සංවර්ධනය සමඟ, වාර්ෂික සමාලෝචනයන් අවශේෂ වටිනාකම් මත සිදු කරනු ලබන අතර අවශ්‍ය නම්, වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය ගලපනු ලබයි. | තවමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට නිර්දේශ කෙරේ. |
| ii ඉඩම් හා ගොඩනැගිලිවල අවසන් ඇගයීම කළ දින සිට ඒවායෙහි වටිනාකම් සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති බව සමාගම තහවුරු කර ගෙන නොමැත. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා සැම වර්ෂ තුනකට වරක් සම්පූර්ණ ඇගයීමක් සමාගම ලබා ගනී. කෙසේ වෙතත්, පසු ගිය වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු වෙනසක් පවතීද යන්න හඳුනා ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී අතිරේක ඇගයීමක්, අනාගතයේ දී සමාගම විසින් ලබා ගනු ලබයි. | ඉඩම් හා ගොඩනැගිලිවල අවසන් ඇගයීම කළ දින සිට ඒවායෙහි වටිනාකම් සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති බව තහවුරු කර ගැනීමට ඇගයීමක් ලබා ගැනීමට සමාගමට නිර්දේශ කෙරේ. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණට සැන් මිචෙල් සමාගමේ කොටස් 50,000 ක් සඳහා වන කොටස් සහතිකය සැපයීමට නොහැකි විය. | සැන් මිචෙල් සමාගමේ කොටස් සහතිකය මේ වන විට සමාගම් ලේකම් අංශයේ සහ ආයතනික උපදේශන අංශයේ නොපවතී. කොටස් හිමිකාරත්වය තහවුරු කිරීම සඳහා මෙම කරුණ තවදුරටත් තහවුරු කර ඇත. රු.500,000 ක පොත් ශේෂය, ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම කළ ඇති පරිදි වර්ෂ කිහිපයක් පුරා ගිණුම්වල පැවතෙන බව සැලකිල්ලට ගත යුතුය. | බැංකුව තුළ වැදගත් ලියකියවිලි සුරක්ෂිතව තබා ගැනීම සහතික කිරීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.5 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය හිමියන්ගේ තාවකාලික ගිණුම්, හඳුනා නොගත් ඍජු තැන්පතු, ඉදිරිපත් නොකළ ගෙවීම් හා සැළසුම් නොකළ ගෙවීම් එකතු කිරීමේ ගිණුම්වල දීර්ඝ කාලීන හිඟ ශේෂයන් නිරීක්ෂණය විය. දීර්ඝ කාලීන හිඟ ශේෂවල වයස් විශ්ලේෂණය පහත වගුවේ දැක්වේ. | එකඟ වේ. අදාළ අංශ සමඟ සැසඳීම සිදු කරමින් පවතී.ඊට අමතරව, නොසැදෙන සියළු ශේෂ වර්ෂය අවසානයේදී නිරවුල් කිරීමට ප්‍රතිපත්තියක් සංවර්ධනය කළ යුතු අතර 2020 වසර අවසන් වන විට අනුමතිය ලබා ගත යුතුව ඇත. | තාවකාලික ගිණුම්වල දිගු කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ. |

| විස්තරය | හිඟ කාල සීමාව (අවුරුදු) | | | |
| --- | --- | --- | --- | --- |
| | 0-1 | 1 -3 | 3-5 | අවු. 5 ට වැඩි |
| ණය හිමියන් | 2,757,977 | 3, 385,165 | 3,575,125 | 101,876,139 |
| හඳුනා නොගත් ඍජු තැන්පතු | 3,828,498 | 20,178,176 | 13,243,884 | 3,394,665 |
| ඉදිරිපත් නොකළ ගෙවීම් | 227,050 | 4,144,888 | 5,696,461 | 4,846,159 |
| සැළසුම් නොකළ ගෙවීම් එකතු කිරීම | 6,841,504 | 304,012 | - | 7,145,516 |
| එකතුව | 13,655,029 | 28,012,241 | 22,515,470 | 110,116,963 |

## 1.7 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | අත්සන් සහ ප්‍රවේග පද්ධතිය සඳහා වෙනස් කළමණාකරණ මෘදුකාංගයේ ග්‍රහණය කර ඇති වෙනස් කළමණාකරණ ලියකියවිලිවල රාජකාරි වෙන් කිරීම් උල්ලංඝනය කර ඇත. | කළමනාකරණ එන්ජින් වෙනස් කිරීමේ කළමනාකරණ මොඩියුලය (Manage Engine Change Management Module) ක්‍රියාත්මක කිරීමත් සමඟ 2020 සිට ඉදිරියට වෙනස් කළමණාකරණ පද්ධතිය සඳහා ප්‍රමිතිගත ක්‍රියාවලියක් දැනටමත් හඳුන්වා දී ඇත. | අදාළ තොරතුරු තාක්ෂණ යෙදුම්වල රාජකාරි වෙන් කිරීම පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ. |
| ii | යූ.ඒ.ටී අත්සන් සහ ප්‍රවේග පද්ධතියේ අදාළ ව්‍යාපාරික ඒකක විසින් සිදු කිරීම වෙනුවට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | | |
| iii | "යූ.ඒ.ටී සිදු කරන ලද්දේ" යන තොරතුර ප්‍රවේග පද්ධතියේ වෙනස් කළමණාකරණ ලියකියවිලිවල ග්‍රහණය කර නොගනී. | | |
| iv | තොරතුරු තාක්ෂණ-ප්‍රවේග පද්ධතියේ කළමනාකරු යෙදුම, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටම්වලදී ප්‍රවේග පද්ධතියේ පරිපාලක ලෙස කටයුතු කරයි. ප්‍රවේග පද්ධතියේ වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටියට වගකිව යුතු කළමනාකරු, ප්‍රවේග පද්ධතියේ සංවර්ධන කණ්ඩායමේ ප්‍රධානියා වන අතර එය රාජකාරි වෙන් කිරීමේ මූලධර්මය උල්ලංඝනය කරයි. | මෙහි අවධානයට යොමු වන පුද්ගලයා, එම්.බී.එස්.එල් හි වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටියට වගකිව යුතු පුද්ගලයා නොවේ. එම පුද්ගලයාට යෙදුමට දර්ශන ප්‍රවේශය පමණක් ඇත. කෙසේ වෙතත් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග එම්.බී.එස්.එල් විසින් ගනු ලැබේ. | අදාළ තොරතුරු තාක්ෂණ යෙදුම්වල රාජකාරි වෙන් කිරීම පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ. |
| v | ප්‍රවේග පද්ධතියේ සජීවී පරිසරයට සිදු වූ වර්ධනයන් නිරීක්ෂණය කිරීම සඳහා පද්ධතියෙන් ජනනය කළ සංවර්ධන සටහන් නොමැත. | පද්ධතියෙන් ජනනය කළ සංවර්ධන සටහන් ලබා ගැනීම සඳහා, 2021 සිව්වන කාර්තුව සඳහා අයවැය ගත කර ඇති යෙදුම් ජීවන චක්‍ර කළමනාකරණ විසඳුමක් එම්.බී.එස්.එල් හි ක්‍රියාත්මක කළ යුතුය. එතෙක්, එම්.බී.එස්.එල් විසින් සංවර්ධන සටහන් පවත්වාගෙන යාම සඳහා පවත්නා අතින් සිදු කරන ක්‍රියාවලිය දිගටම කරගෙන යනු ඇත. | සජීවී පරිසරයට සිදු කරන ලද වර්ධනයන් නිරීක්ෂණය කිරීම සඳහා පද්ධතියෙන් ජනනය කරන ලද සංවර්ධන සටහන් ලබා ගැනීමට නිර්දේශ කෙරේ. |
| vi | සමාගම විසින් යල්පැනගිය ආපදා ප්‍රතිසාධන සැලැස්මක් භාවිතා කරන අතර එය අවසන් වරට 2014 අගෝස්තු 14 වන දින සංශෝධනය කර තිබුණි. | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා අයි.එස්.ඕ : 27001 (අයි.එස්.එම්.එස්) සහතිකය සමඟ මෙය යාවත්කාලීන කරනු ලබයි. | බැංකුවේ ආපදා ප්‍රතිසාධන සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| vii | සමාගම මූල්‍ය කාල සීමාව තුළදී පවත්නා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (බී.සී.පී) පරීක්ෂා කර නොතිබුණි. | එකඟ වේ. සම්පූර්ණ කිරීමට ඉලක්කගත දිනය 2021 අගෝස්තු වේ. | සමාගමේ පවත්නා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පරීක්ෂා කිරීමට නිර්දේශ කෙරේ. |
| viii | සක්‍රිය නාමාවලියෙන් ''අක්‍රිය කිරීමේ දිනය'' ලබා නොදීම හේතුවෙන් ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් ප්‍රවේශ පද්ධතියෙන් කාලීනව අක්‍රිය කිරීම, සමාලෝචනය කිරීමට නොහැකි විය. | ඒ.ඩී පරිශීලක ගිණුමට පරිශීලක ඇතුළත් වූ අවසන් දිනය ග්‍රහණය කර ගැනීමට ප්‍රවේශ පද්ධතිය සැලසුම් කර නොමැත. පරිශීලක අක්‍රිය කිරීමේ දිනය පවත්වාගෙන යාමට ඒ.ඩී විසින්ම ගොඩනංවන විකල්පය ලබා දී නොමැත. කෙසේ වෙතත් සියලුම පරිශීලක නිර්මාණය / මාරු කිරීම / අවසන් කිරීමේ තොරතුරු ප්‍රවේග යූ.එම්.එස් (පරිශීලක කළමනාකරණ පද්ධතිය) මඟින් ග්‍රහණය කර ගනී. | පරිශීලක ඇතුළත් වූ අවසන් දිනය ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රවේශ පද්ධතියට අවශ්‍ය වෙනස්කම් කිරීමට නිර්දේශ කෙරේ. |
| ix | ප්‍රවේශ පද්ධතිය තුළ එක් සේවකයෙකු පරිශීලක ගිණුම් දෙකකට (සේවක හැඳුනුම්පත මත පදනම්ව) ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. | මෙම ඇතුළත් කිරීම් වලින් එකක් අවලංගු වේ. එබැවින්, අවලංගු ඇතුළත් වීම අක්‍රිය කර ඇති අතර පරිශීලක ඇතුළත් වීමේ දත්ත මකා දැමීමට පද්ධතියට නොහැකි බැවින් නිවැරදි තොරතුරු සහිතව එකම පරිශීලකයා නැවත පද්ධතියට ඇතුළත් වී ඇත. | ද්විකරණයන් වළක්වා ගැනීම සඳහා පද්ධතියට අවශ්‍ය වෙනස් කිරීම් සිදු කිරීමට නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 57 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 447 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 390 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසු ගිය වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී පොලී වියදම වැඩිවීම , හානිකරණ ගාස්තු වැඩිවීම හා වෙනත් මෙහෙයුම් ආදායම් අඩු වීම මෙම පිරිහීමට හේතු වී ඇත.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතය සමඟ පහත දැක්වේ.

| විස්තරය | 2019 ( රු. 000) | 2018 ( රු. 000) | වෙනස (%) | විචල්‍යතාවයට හේතුව |
|---|---|---|---|---|
| පොලී සහ ඒ හා සමාන වියදම් | 4,331,275 | 3,752,471 | 15.4 | සියයට 9 ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් තැන්පතු පදනම 2018 දී බිලියන 21 සිට 2019 අවසන් වන විට බිලියන 23 දක්වා ඉහළ ගොස් ඇත. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 68,938 | 177,129 | 156.9 | දේපල වෙළඳාම් විකිණීමෙන් ලැබෙන ලාභය, බොල් ණය ආපසු අයකර ගැනීම සහ දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභය/(අලාභය) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් සියයට 4, 33 සහ 992 කින් අඩු වී ඇත. |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු | 279,673 | 134,531 | 107. 9 | සමස්ථ කර්මාන්තයේම පවතින තත්වයට සමානව පෙර වර්ෂයට සාපේක්ෂව අක්‍රීය ණය අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 22 කින් වැඩි වී ඇත. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසු ගිය වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාතයන් පහත දැක්වේ.

| විස්තර | කර්මාන්තයේ අනුපාතය * | සමාගම 2019 | සමාගම 2018 |
|---|---|---|---|
| කාර්ය සාධන අනුපාත | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 10.6 | 4.0 | 6.3 |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 1.0 | 0.28 | 0.51 |
| පොලී ආන්තිකය | 3. 6 | 6.52 | 7.83 |
| වත්කම්වල ගුණාත්මක අනුපාතය | | | |
| ශුද්ධ අක්‍රීය අත්තිකාරම් (එන්.පී.එල්) | 4.6 | 7.93 | 6.51 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත | | | |

| ව්‍යවස්ථාපිත අනුපාතය | අවම අවශ්‍යතාව | 2019 | 2018 |
|---|---|---|---|
| ස්ථර 1 ප්‍රාග්ධනය | 6.5 | 5.6 | 5.42 |
| මුළු ප්‍රාග්ධනය | 10.5 | 8.78 | 9.88 |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 20 | 12.30 | 10.20 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | සමාගම විසින් සෙලන් සමූහ සමාගම්වල වාණිජ පත්‍රිකා සඳහා රු. මිලියන 130 ක් ආයෝජනය කර ඇත. පසුව ආයෝජනය කරන ලද සමාගම් බංකොලොත් වූ අතර බැංකුව විසින් රු. මිලියන 435 ක මුළු ආයෝජනය පොත්වල තබා ගෙන ඇත. මෙම මුදල ආපසු අයකර ගත නොහැකි බව කළමනාකාරීත්වය අදහස් කරන අතර එම මුදල සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. කෙසේ වෙතත්, මෙම මුදල ඉදිරියට ගෙන යයි. | එකඟ වේ.<br>කපා හැරීම සඳහා මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි. 2020 අවසන් වන විට අවසන් කිරීමට අපේක්ෂා කරයි. | අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසු අයකර ගත නොහැකි ශේෂයන් කපා හැරීමට නිර්දේශ කෙරේ. |
| ii | 2019 දී සිදු වූ වංචා සහ වැරදි හේතුවෙන් සමාගමට රු. 45,203,058 ක අලාභයක් වාර්තා වී ඇති අතර රු. 8,056,058 ක් අයකර ගැනීමට හැකි විය. සමාගම විසින් වර්ෂය තුළ සිදු වූ වංචා සිද්ධීන් හා සම්බන්ධ සේවකයින් 18 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. | කිසිදු නඩු පැවරීමකින් තොරව අය කර ගත හැකි මුදල් ආපසු අයකරගෙන ඇති අතර අනෙකුත් ඒවා නීතිමය ක්‍රියාවලියකට යටත් වේ. | වංචා වළක්වා ගැනීම සඳහා සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට නිර්දේශ කෙරේ. |

### 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | 2020 ජනවාරි 17 වන දින රු. මිලියන 165.8 ක ව්‍යාපෘති පිරිවැයක් දරන "කොට්ටාව, හොරාහේන" ව්‍යාපෘතිය සමාගම විසින් සම්පූර්ණ කර ඇති අතර එය නිම කිරීම සඳහා මාස 8 ක ප්‍රමාදයක් නිරීක්ෂණය කරන ලදි. | අප භූමිය සංවර්ධනය කරමින් සිටියදී, වසංගත තත්ත්වය හේතුවෙන් රට මුළුමනින්ම වසා දමා තිබූ බැවින් 2020 මාර්තු 19 සිට 2020 ජූලි මැද දක්වා සමස්ත ව්‍යාපෘති මෙහෙයුම් නතර කිරීමට අපට සිදුවිය.<br>කොරොනා කාල පරිච්ඡේදය තුළදී, අපි විකුණුම් ආරම්භ කර සියලුම කොටස් විකුණා, අයවැය ලාභය අත්කර ගෙන ඇත. (අවසාන කොටස 2020.11.11 දින විකුණන ලදි). | ව්‍යාපෘතිය කාලානුරූපව නිම කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| ii | රු. මිලියන 138.3 ක ව්‍යාපෘති පිරිවැයක් ඇති "මාඩම්පෙල්ල" ව්‍යාපෘතිය 2020 මාර්තු 17 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද 2020 දෙසැම්බර් මාසයේදීත් එය අවසන් කර නොමැත. | සංවර්ධනයේ ප්‍රගතිය ප්‍රමාද වීම හේතුවෙන් 2020 පෙබරවාරි 26 වන දින තෝරාගත් කොන්ත්‍රාත්කරු සංවර්ධන කටයුතු වලින් ඉවත් කරන ලදී.<br>එබැවින් අප ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර දෙවන අඩුම කොන්ත්‍රාත්කරු තෝරා ගන්නා ලදී.<br>අප භූමිය සංවර්ධනය කරමින් සිටියදී, වසංගත තත්ත්වය හේතුවෙන් රට මුළුමනින්ම වසා දමා තිබූ බැවින් 2020 මාර්තු 19 සිට 2020 මැයි 22 දක්වා සමස්ත ව්‍යාපෘති මෙහෙයුම් නතර කිරීමට අපට සිදුවිය.<br>අපි 2020 මැයි 22 දින සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන ලදී.<br>කොරෝනා 02 වසංගතය හේතුවෙන් ගම්පහා දිස්ත්‍රික්කය වසා දමා තිබීම නිසා 2020 ඔක්තෝබර් 04 සිට 2020 දෙසැම්බර් 10 දක්වා සමස්ත ව්‍යාපෘති මෙහෙයුම් නැවත නැවැත්වීමට අපට සිදුවිය.<br>අවසානයේදී, අපි 2020 දෙසැම්බර් මස අවසන් වන විට එහි සංවර්ධනයන් සම්පූර්ණ කළ ඇත.<br>අපි විකුණුම් ආරම්භ කළ අතර මේ වන විට අපි විකුණුම් වලින් 25% ක් සම්පූර්ණ කළ ඇත. | ව්‍යාපෘතිය කාලානුරූපව නිම කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 වන විට බැංකුවේ තථ්‍ය සේවක සංඛ්‍යාව සේවකයින් 1,000 ක් වූ අතර අනුමත සේවක සංඛ්‍යාව 1,338 කි. එබැවින් එම දිනය වන විට පුරප්පාඩු 338 ක් පවතී. | අනාගත ව්‍යාපාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඒ අනුව සේවක සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. | සමාගමේ පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |